

තනතුරු පුරප්පාඩු
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - HM 2-1 - තනතුරු 01

අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

(1) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ ආචාර්ය උපාධියක් ලබා තිබීම සමඟ කළමනාකරණ මට්ටමේ වසර 10 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් සමඟ ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් ශාස්ත්‍රපති/විද්‍යාපති පශ්චාත් උපාධියක් හෝ ඊට නොඅඩු මට්ටමක වෙනත් පිළිගත් වෘත්තිය සුදුසුකම් ලබා තිබීම හා කළමනාකරණ මට්ටමේ වසර 18 ක පළපුරුද්දක් ද, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 01 ක පළපුරුද්දක් සමඟ ද ලබා තිබීම

ඉහත සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමට පත්වීමට පෙර ලබා තිබීම අවශ්‍ය වේ. එසේ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරාලීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 01ක පශ්චාත් පළපුරුද්දක් ලබා තිබීය යුතුය.

ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම - සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ ආචාර්යය උපාධියක් ලබා තිබීම.

සහ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අධ්‍යක්ෂ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

ආපදා කළමනාරකණ කේෂ්ත්‍රයේ ලබා ඇති වෘත්තීමය පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියළුම අංශයන්හි කටයුතු සම්බන්ධයෙන් වගකීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉහල කළමනාකරණ මට්ටම් හි සියළුම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය.

ii. ආපදා අවදානම අවම කිරීම සම්බන්ධයෙන් වූ මාර්ග සිතියම් සකස් කිරීම සම්බන්ධ වගකීම.

iii. හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් වූ හදිසි ආපදා මෙහෙයුම් සැලැසුම්, ජාතික ආපදා

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

කළමනාකරණ සැලැසුම සකස් කිරීම සම්බන්ධයෙන් යාන්ත්‍රණයක් සැකසීමේ වගකීම.

iv. 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතෙහි පෙන්වා දී ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් අවම කිරීම සඳහා සියළුම අමාත්‍යාංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ අධාර කණ්ඩායම් අතර සම්බන්ධීකරණය.

v. ශ්‍රී ලංකාවේ ආපදා අවදානම කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය කිරීම, පාලන කිරීම මග පෙන්වීම සහ ක්‍රියාත්මක කිරීම.

vi. සියළුම දිසත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා සියළුම දිස්ත්‍රික් ඒකකවල මාසික වැඩසටහන් හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

HM 2-1 - 2025 - රු 161.140 -12x4850 – 219.340
ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවු : 40 ට නොඅඩු හා අවු : 50 ට නොවැඩි ය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. අධ්‍යක්ෂ(මානව සම්පත් හා පරිපාලන) – HM-1-1 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

(1) අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය හෝ කළමනාකරණය, වාණිජ්‍ය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සමග

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම - සුදුසුකම්**

ඉහත සඳහන් භාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආයතනයේ පුද්ගල හා පාලන කටයුතු
ii. කාර්යාල පද්ධතිය දියුණු කිරීම හා නඩත්තු කිරීම
iii. මානව සම්පත් සංවර්ධනය, බඳවා ගැනීම් , පුද්ගල කළමනාකරණය හා උපායමාර්ගික හා ප්‍රතිපත්ති සැකසීම
iv. ප්‍රවාහන කටයුතු සංවිධානය කිරීම
v. ආයතනය හා සම්බන්ධ වන නිති කටයුතුවලට අදළ රාජකාරී ඉටු කිරීම, අවශ්‍ය අවස්ථාවලදී ආයතනය වෙනුවෙන් උසාවියේ/කම්කරු උසාවියේ පෙනී සිටීම.

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

HM 1-1 - 2025- රු.140,640 -15 x 4,100 – 202,140.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්) – HM-1-1 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

(1) **අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කලා හෝ වාණිජ හෝ විද්‍යා හෝ යන විෂය කේෂ්ත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධියක් සමඟ අදාළ කේෂ්ත්‍රයෙන් ලබාගත් විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධිය

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක “කළමනාකාර මට්ටමේ” තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම - සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ස්ථාපිත සැළැස්ම හා මාර්ග සැලැස්ම අනුව අංශයේ කටයුතු උපායමාර්ගිකව සැළසුම් කිරීම
ii. ආපදා කළමනාකරණය හා ආපදා අවදානම අවම කිරීම පිළිබඳව පාසල් සිසුන් අතර, අධ්‍යාපන ආයතන තුළ, රාජ්‍ය සේවකයින් හා පොදු මහජනතාව අතර දැනුවත් භාවය ඉහළ නැංවීම හා ඒ සඳහා වන උනන්දුව ඉහළ නැංවීම

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

iii. විශ්ව විද්‍යාල විෂය මාලාව තුළට ආපදා අවදානම අවම කිරීම ඇතුළත් කිරීමට කටයුතු කිරීම හා ඒ සඳහා උපාධිධාරින්ට පහසුකම් සැපයීම හා දැනුවත් භාවය වැඩි කිරීම
iv. අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව පාසල් ආරක්ෂණ වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම
v. පුහුණු හා කෙටි පාඨමාලා මඟින් ව්‍යාප්තීමය කණ්ඩායම් අතර ආපදා කළමනාකරණය හා ආපදා අවදානම අවම කිරීම පිළිබඳව දැනුවත් බව වැඩි කිරීම
vi. ප්‍රධාන ආයතයන්හි නිලධාරින් පුහුණු කිරීම හා පුහුණු ආම්පන්න සැපයීම මගින් එම ආයතනයන්හි ධාරිතාව ඉහළ නැංවීම
vii. අඛණ්ඩ අධ්‍යාපන විෂය පථයට ආපදා කළමනාකරණය ඇතුළත් කිරීම සඳහා කටයුතු කිරීම
viii. ජාතික ආපදා කළමනාකරණ සභාවේ රැස්වීම් සම්බන්ධීකරණය
ix. ආපදා කළමනාකරණය හා ආපදා අවම කිරීම පිළිබඳව කොළඹ ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් කාර්යාලවල සේවක මණ්ඩලය පුහුණු කිරීම
x. අවශ්‍ය වූ විට ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කිරීම
xi. අංශයේ වාර්ෂික අයවැය සැකසීම, ව්‍යාපෘති සැකසීම, භෞතික හා මූල්‍යමය ප්‍රගතිය අධීක්ෂණය
xii. සේවක මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය හා අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අවශ්‍ය කාර්යාලීය පරිසරය සැකසීම

ඈ. වැටුප් ක්‍රමය :

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

HM 1-1 - 2025- රු.140,640 -15 x 4,100 – 202,140.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. වයස :

අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

04. අධ්‍යක්ෂ (පෙර සුදානම්) – HM-1-1 - තනතුරු 01

අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

(2) අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කලා හෝ වාණිජ හෝ විද්‍යා හෝ යන විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයෙන් ලබාගත් විද්‍යාපති / ශාස්ත්‍රපති උපාධිය

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම - සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය , ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම, ජාතික හදිසි ප්‍රතිචාර සැලැස්ම සැකසීම, සමාලෝචනය යාවත්කාලීන කිරීම හා සම්බන්ධීකරණය
ii. ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා ඇති විය හැකි ආපදා සඳහා පෙර සුදානම් සැළසුම් සැකසීම, සම්බන්ධීකරණය කිරීම
iii. ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුකූලව රාජ්‍ය අංශයේ සියළුම ආයතන සඳහා ආපදා කළමනාකරණ සැලැස්මක් සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම
iv. අධ්‍යාපන අමාත්‍යාංශය හා පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
v. ආරෝග්‍යශාලාවන්ට හදිසි අවස්ථා සුදානම් සැළසුම් යාන්ත්‍රණයක් සැකසීම
vi. පළාත් මහනගර සභා හා නගර සභා මට්ටමින් හදිසි ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධණය
vii. පළාත් ,දිස්ත්‍රික්, කොට්ඨාශ, ග්‍රාම නිලධාරි මට්ටමින් ආපදාවන්ට ගොදුරු විය හැකි ප්‍රදේශ හඳුනා ගෙන පෙර සුදානම් සැළසුම් සැකසීම හා ඒවා ශක්තිමත් කිරීම
viii. සංස්ථාපිත සැලැස්ම හා මාර්ග සැලැස්ම අනුව අංශයේ ක්‍රියාකාරකම් උපායමාර්ගිකව සැළසුම් කිරීම
ix. අවශ්‍ය අවස්ථාවන්හි ජාතික හා අන්තර් ජාතික වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කිරීම
x. වාර්ෂික අයවැය යෝජනා, වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සෑදීම එහි භෞතික හා මුල්‍යමය ප්‍රගතිය අධීක්ෂණය
xi. අංශයෙන් බලාපොරොත්තු වන සේවය ලබා දීම සඳහා අවශ්‍ය පරිසරය සැකසීම හා අංශයේ සේවකයන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

HM 1-1 - 2025- රු.140,640 -15 x 4,100 – 202,140.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

05. සන්නිවේදන කාර්මික ශිල්පී - MA 2-1 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

අධ්‍යාපන සුදුසුකම් :

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් සන්නිවේදන කාර්මික ශිල්පී තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ආ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. පූර්ව දැනුම් දීමේ කුළුණු පද්ධතිය හා ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය ඇතුළු ඒ හා සම්බන්ධ අනිකුත් උපකරණ සම්බන්ධ සේවා හා නඩත්තු කටයුතු.
ii. ද්විත්ව මාර්ගික ජංගම දුරකථන, ස්ථාවර හා ජංගම ගුවන්විදුලි උපකරණ, ඇන්ටෙනා, පුනරාවර්තක, වීඩියෝ කැමරා හා අනිකුත් උපකරණයන් සවිකිරීම, ආරක්ෂාව හා ඒවා සම්බන්ධ කිරීම හා පරීක්ෂාව.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

iii. අත් ආයුධ හා බවුතය භාවිතයෙන් ක්‍රියාවිරහිත කොටස් ඉවත් කර නිවැරදි කොටස් යොදා සැකසීම. විදුලි රැහැන් ඇදීම හා නිවැරදි යාන්ත්‍රික කොටස් සවිකිරීම.

iv. දෝලනේක්ෂය, සංඥා ජනකය, ඇමීටරය, වෝල්ට් මීටරය හා අනිකුත්විශේෂිත අත් ආයුධ මිනුම් හා පරීක්ෂණ උපකරණ භාවිතයෙන් විද්‍යුත් උපකරණ පරීක්ෂාව.

v. අව්‍යශතාවය මත විද්‍යුත් සන්නිවේදන පද්ධතීන්ගේ ක්‍රියාකාරීත්වය උපකරණවල ක්‍රියාකාරීත්වය හා එම උපකරණයන්ට අදාලව නිවැරදි තෙරතුරු පවත්වාගෙන යාම.

vi. පිළියවනය (Relay), විදුලි යතුරු(switches), දඟර(coils), දර්ශක පහන්(Indicator lamp),ශබ්ද විකාශන යන්ත්‍ර, ස්වයංකීය පහන් ආදී උපකරණ වල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම.

vii. ඉතා සූක්ෂම හා නිරවද්‍ය යාන්ත්‍රික ආයුධ අවශ්‍ය නොවන අවස්ථාවල ක්‍රියාවිරහිත කොටස් සඳහා ආදේශක යෙදීම හා ඒවා ගලපා සැකසීම.

viii. නැංවුම, උපකරණ, යතුරු, Relays , හා මානක පිරිසිදු කිරීම, තද කිරීම හා ඒවායේ සම්බන්ධතාවයන් සැකසීම.

ix. තනතුරට අදාළව කළමනාකාරිත්වය පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

MA2-1 - 2025- රු.50,540-10x540-07x630-04x890 - 20x1190 – 87,710.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඈ. **වයස :**

අවුරුදු18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

06. තොරතුරු තාක්ෂණ සහකාර - MA 2-1 - තනතුරු 03

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

අධ්‍යාපන සුදුසුකම් :

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් තොරතුරු තාක්ෂණ සහකාර තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ආ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. භූ තොරතුරු තාක්ෂණය මගින් මෘදු හා දෘඩ සිතියම් නිර්මාණය කිරීම සහ තොරතුරු පද්ධති අධීක්ෂණය, විශ්ලේෂණය, සිතියම් ගත කිරීම හා බෙදා හැරීම.

ii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක වන පරිගණක ජාල නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම.

iii. විද්‍යුත් තැපෑල නිසිපරිදි පවත්වාගෙන යාම

iv. සාමාන්‍ය දුරකථන නඩත්තුව හා ඊට අදාල ගෙවීම් පිළිබඳ කටයුතු.

v. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතු සියළුම පරිගණක පද්ධති නඩත්තු කිරීම සහ විද්‍යුත් උපාංග නිසි පරිදි පවත්වාගෙන යාම.

vi. මධ්‍යස්ථානයේ නිලධාරීන්ට අවශ්‍ය අවස්ථාවන් වලදී විද්‍යුත් තැපෑල, පරිගණක සහ අන්තර්ජාල පහසුතම් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සහ පුහුණු පාඨමාලා පැවැත්වීම.

vii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි වෙඩ් අඩවිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.

Gazette.lk AMBITIONS REALIZED

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

MA2-1 - 2025- රු.50,540-10x540-07x630-04x890 - 20x1190 – 87,710.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඈ. **වයස :**

අවුරුදු18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

07. පත්වීමේ ස්වභාවය :

අ. ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවාදායකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

ආ. බාහිර අයදුම්රුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

ඇ. අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය එක් අවුරුදු වැඩබැලීමේ කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

08. වෙනත් අවශ්‍යතා :

සෑම අයදුම්කරුවෙක්ම;

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ඇ. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

09. අයදුම්පත් එවිය යුතු ආකාරය :

අයදුම්පත www.dmc.gov.lk වෙබ් අඩවියේ පළ කොට ඇති අතර ඒ අනුව සකස් කර ගත් අයදුම්පත් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026.12.02 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අංක 120/2, විද්‍යා මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්කරු විසින් තම අයදුම්පත්‍රයේ "බාහිර අයදුම්කරුවෙකු" ද , "අභ්‍යන්තර අයදුම්කරුවෙකු" ද යන්න පැහැදිලිව සඳහන් කල යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, " අයදුම් කරන තනතුර" පැහැදිලිව ලියා දැක්විය යුතු වේ.

අයදුම්පත්‍රය සමඟ අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක්, ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහ තමා සතු සියළුම අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික යන සහතිකයන්හි පිටපත් එවීම **අනිවාර්යය වේ.** තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වග කියනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, හෝ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වුවන් සිය අයදුම්පත්‍රය ආයතනයේ ප්‍රධානියා මඟින් එවිය යුතු අතර එසේ නොඑවන සහ **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පසුව මෙම මධ්‍යස්ථානය වෙතට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැලකිය යුතුයි:

මෙම දැන්වීම www.dmc.gov.lk යන වෙබ් අඩවියේ පලකොට ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
අංක 120/2
විද්‍යා මාවත
කොළඹ 07

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED